වාරිමාර්ග චක්‍රලේඛ අංක:- 05/2023

මගේ අංකය: GA/6/4/12

පාලන ඒකක 06,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

2023.06. 05

සියළුම අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)/ප්‍රධාන මූල්‍ය නිලධාරී,
අධ්‍යක්ෂ(පරිපාලන) /වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්(ප්‍රධාන කාර්යාලය) /කලාප වාරිමාර්ග අධ්‍යක්ෂවරුන්/
යාන්ත්‍රික අධ්‍යක්ෂවරුන්/ප්‍රධාන ගණකාධිකාරීවරුන්/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,
ප්‍රධාන ඉංජිනේරුවරුන් / ගණකාධිකාරීවරුන් / නීති නිලධාරී,
සියළුම ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරුන්,
සියළුම පරිපාලන නිලධාරීන්,

## වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය - 2022

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය, කාලීන අවශ්‍යතා අනුව නැවත සලකා බැලීමට කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණය සඳහා කමිටුවක් පත් කළ අතර එම කමිටු වාර්තාව අංක GA/6/5/කාර්ය මණ්.ප්‍රති./2022 හා 2022.11.14 දිනැති " වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය කමිටුවක් මගින් නැවත බෙදා හැරීම " මැයෙන් වූ ලිපිය මගින් මා වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්තාව පිටු අංක 01 සිට 31 දක්වා උපලේඛන 07කින් ද උපලේඛන අංක 01 යටතේ යාන්ත්‍රික කාර්යාල/ කලාප කාර්යාල/ දිසා කාර්යාල ඇතුළත් ඇමුණුම 03 කින්ද සමන්විත වේ. එමගින්, ප්‍රධාන කාර්යාලයේ අංශ/ වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල/ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල/ යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාල /යාන්ත්‍රික ඉංජිනේරු කාර්යාල හා දිසා කාර්යාලවල රාජකාරී ස්වභාවය සලකා බැලීමෙන් අනතුරුව වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත සියළුම තනතුරු කාර්යාල හා අංශ අතර බෙදා දක්වා ඇත.

02) එම වාර්තාව සම්බන්ධව උප දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් නිරීක්ෂණ කැඳවූ අතර ඒ අනුව ලද යෝජනා හා ඉල්ලීම් සලකා සංශෝධනයන් ඇතුළත් කරමින් "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණය -2022" වාර්තාව මා විසින් අනුමත කරන ලදී. එබැවින් මේ දක්වා ක්‍රියාත්මක වූ, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය අනුමත කරන ලද අංක DI (EST) Work III හා 2013.12.02 දිනැති, " අනුමත සේවක සංඛ්‍යාව - ප්‍රධාන කාර්යාලය" හා "අනුමත සේවක සංඛ්‍යාව - කලාපය/දිසාව/කාර්යාලය" යන මැයෙන් වූ ලිපි මෙම චක්‍රලේඛය බලාත්මක වන දින සිට අවලංගු වේ.

03) තවද, කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/G2/56/15/01(Vol.1) හා 2013.01.21 දිනැති ලිපිය සමග වූ වාර්තාව මගින් පහත තනතුරු එම තනතුර දරන්නාට පෞද්ගලික වන සේ පසුව අහෝසි වීමට යටත්ව අනුමත කර ඇති බැවින් එම තනතුරු "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණය -2022" වාර්තාවේ ඇතුළත් වුවද ඒ සඳහා පුරප්පාඩු ඇති නොවන බවත් නැවත එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු නොවන බවත් දන්වමි.

| අනුමත ලේඛන අංකය | තනතුර |
|---|---|
| 71 | යතුරු ලේඛක |
| 72 | ලිපිකරු |
| 104 | හෝරාමාපක අළුත්වැඩියාකරු |
| 114 | ජල පාලක |
| 115 | වැඩ පරිපාලක(කාර්යය නියුක්ත පදනම මත) |
| 116 | කම්කරු |
| - | 25/2014 කම්කරු |

04) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර ඇති සංවර්ධන නිලධාරීන් 243, "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණය -2022" වාර්තාවේ බෙදා දක්වා තිබුණ ද රැකියා විරහිත උපාධිධාරීන් රැකියාගත කිරීම - 2020 යටතේ මෙම දෙපාර්තමේන්තුවට නවක සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ඇති බැවින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව සඳහා සංවර්ධන නිලධාරි තනතුරු 361ක් අනුමත කර ගැනීමට අතිරේක අධ්‍යක්ෂ ජනරාල්(පාලන) විසින් අංක GA/3/6/Carder/2022 හා 2022.09.20 දිනැතිව ඉල්ලීම් ලිපියක් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත. ඒ සඳහා අනුමැතිය ලද වහාම එම තනතුරු ද අංශ හා කාර්යාල අතර බෙදා හැරීම සම්බන්ධ නියමයන් නිකුත් කරනු ලැබේ.

05) ඔබ කාර්යාලයට අනුයුක්තව සිටින කාර්ය මණ්ඩල සංඛ්‍යාව "වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගතකරණය - 2022" වාර්තාවෙහි සඳහන් අනුමත කාර්ය මණ්ඩල සංඛ්‍යාව සමඟ ගැළපිය යුතු අතර අනුමත සංඛ්‍යාව ඉක්මවා යම් තනතුරක නිලධාරීන් / සේවකයින් සිටී නම් එම අතිරික්තය කලාපයේ තිබෙන ප්‍රාදේශීය කාර්යාලවල පවතින පුරප්පාඩු සමග ගළපා ගත යුතු බව දන්වමි.

06) මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2023.06.01 දින සිට ක්‍රියාත්මක වේ. එබැවින් මෙම චක්‍රලේඛයේ විධිවිධාන පිළිබඳව ඔබ කාර්යාලයේ සියලු නිලධාරීන් හා සේවකයින් දැනුවත් කරන ලෙස මෙයින් දැනුම් දෙමි.

ඉංජි. දීපිකා ප්‍රියානි ත්‍රිමහවිතාන
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ඉංජි.දීපිකා ප්‍රියානි ත්‍රිමහවිතාන
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්